**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2016/2018 සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2016/2017**

**දෙවෙනි සෙමෙස්තරය**

**MAS 611 – සමාජය හා පරිසරය**

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න**

*කාලය : පැ (03) යි*

---

1. සංස්කෘතික පරිසර විද්‍යාව යනු කුමක්දැයි නිර්වචනය කොට මානව චර්යාව කෙරෙහි පරිසරයේ බලපෑම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

2. 'සමාජය හා පරිසරය අතර ඇති සබඳතාව අවබෝධ කර ගැනීමෙහි ලා දේශපාලන පරිසර විද්‍යාව වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

3. (i) 'ස්වභාවික ව්‍යසනය' යන පදයෙන් අදහස් වන්නේ කුමක්දැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න

   (ii) ශ්‍රී ලංකාවේ සිදුවන නායයෑම් වල සමාජ සංස්කෘතික හා දේශපාලන පැතිකඩයන් සාකච්ඡා කරන්න.

4. 4.1 පාරිසරිකවාදය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

   4.2 බිම් මට්ටමේ පාරිසරික ක්‍රියාකාරකම් ඇසුරින් ලාංකේය සිවිල් සමාජයේ විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න.

**අ.පි.බ.**

5. "ජනගහන වර්ධනය පරිසර ප්‍රශ්න ඇති කරයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? අදාළ න්‍යායික තර්කයන් උපයෝගී කර ගනිමින් විචාර පූර්වකව සාකච්ඡා කරන්න.

6. මිනිස් - වන සත්ව ගැටුම සමාජ විද්‍යාත්මක රාමුවක් තුළ වටහා ගත යුතුය යන අදහස සමඟ ඔබ එකඟ වන්නේද? සමකාලීන ලාංකේය සමාජයෙන් උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

7. 'තිරසාර ඝන අපද්‍රව්‍ය කළමණාකරනය ඉංජිනේරුමය හෝ තාක්ෂණික විසඳුම් මත පමණක් නොව සමාජ ආර්ථික හා දේශපාලන සාධක මත රඳා පවතී. මෙම ප්‍රකාශය විචාර පූර්වකව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් ඕනෑම මාතෘකා **<u>දෙකක් (02)</u>** පිළිබඳව කෙටි රචනාවන් ලියන්න.

    1. පාරිසරික අවදානම
    2. පාරිසරික ස්ත්‍රීවාදය
    3. මානවවංශ ජීව විද්‍යාව
    4. නාගරික දේශපාලන පරිසර විද්‍යාව

**************